පහන් වැට තුළට විත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්



## -වියත් පන්හිඳ-

*වියත් කවියන් ලොව දකින හැටි අපූරුය... සොඳුරුය... එවන් කවියන්ගේ කවි.... රස විඳින්නටත්, කවිය කුමක්ද යන්නට අර්ථ සපයා ගන්නටත් මහගු අත්වැලක් වනු ඇත. වියත් පන්හිඳ එයට වෑයමකි.*

## තාත්තා

මිනී වල ළඟ පස් පිඩැලි උඩ
සැඳෑ කළුවර වාඩි වෙන විට
සෙමින් පියමැන දෑත් අවුරමි
නිවෙන්නට යන බකටි පහනට

කොස් ගහේ මුදුනේ ජනේලෙන්
සඳ එබී ගෙට අඬ ගහන විට
මැකී යයි නියරෙන් එගොඩ වී
පන්සලට යන සුදු ඇඳුම් පෙළ

කඳු මුදුන් වල ලයිට් කණු හිස
මීදුමට දිය වෙලා යන විට
මළ හිරුගෙ මුහුණුවර තිබුණත්
පුංචි තරුවක් ගමට මොකටද

**රත්න ශ්‍රී විජේසිංහ**

## කඳුළු සහ සිතුවිලි



නෙතු පියන් වසා
සිදුරු කර හද
නෙතග කඳුලින්..
ගලා හැලෙන්නට
ඉඩ දුන්නා
පරක් තෙරක් නැති
ඉමක් කොණක් නැති
බුර බුරා අග්නිය සේ දැල්වෙන
සිතුවිලි ධාරාවලියට
තවත් ගලන්නට...

දැවී දැවී මැවී මැවී පිළිස්සෙන ..
සිතුවිල්ල රළුමය..
සැනසිල්ල නැතිමය..
රුහිරු කඳ මත මිරිකෙමින් එන
දුක් ගඟුළ නොනිමය..
නෙතග අඳ කර හදින්
ඉඩ දුන්නෙමි කඳුළැල්ලට
උණු වී ගලන්නට...
පියෙන් පිය සිසිල් වී
මා ජය පාමුල
එය හසරැල්ලකි
නිවා දමන්නට සිතුවිලි රළු
සන්සුන්ව වැතිරෙයි
වෙන්වීම - එක්වීම
ආදරයමැයි කොඳුරමින්
සැනසීම කඳුළමයි පවසමින්....

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

සන්නස පහන් වැටෙහි අරමුණ කවියට, කලාවට ලැදි පරපුරක් බිහි කිරීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමයි. උපරිමයෙන් කවි පිටුව පුරවන්නේ ද මෙනිසාය. තතනමින් පද එකතු කර, කවියක් සේ තම සිතැඟි ඉදිරිපත් කරන කවරෙකුට වුවද සන්නසෙහි ඉඩ සැදෙනුයේ ඔහු මතු දිනයෙක දක්ෂ, යහපත් කවියෙකු වනු දැකීම උදෙසාය. පහන් වැට ඔබගේම වන්නේ ද එනිසාය.

*ඔබේ නිර්මාණ මෙම ලිපිනයට එවන්න.*
Sannasa Pahan Weta
61 Nattle Drive
Hallam Vic 3803
Australia
**Email:** sannasanews@gmail.com

## A song for tea

From dawn to dusk the tender leaves
I pluck, pluck and pluck
As I toil, my sweat drop
To earn that mighty buck
My memory runs like a thunder strike
On a dark and rainy day
Nothing has changed in our lives so far
It's just like yesterday
How we were brought for cheap labour
By the whites from far away
They sell our sweat in various blends
And make the whole world pay
"Any time is tea time" they say
When they drink the best
We drink the dust and work all day
Without nourishment and rest
I slog and slave just to live
And feed the mouths at home
But I earn much more as foreign exchange
That keeps the country warm
I am called a coolie! With no respect!
For the work I do with pain
With an iron will I sing aloud
That my labour won't be in vain
If, I am called a worker
Of dignity, fame and skill
A human being, and a woman at that
As with pride I stand still
From dawn to dusk the tender leaves
I pluck, pluck and pluck
As I toil, my sweat I drop
To earn that mighty buck

**Mallika**
Berlin

## නිළිය හා ප්‍රේක්ෂකයා

ප්‍රේක්ෂකාගාරය දැඩි නිහැඬියාවෙන්
අබිසරු නිළිය වෙත දෙනෙත් හෙළා ඇත
කටාක්ෂ නිරීක්ෂණයෙන් ඇ බලන සඳ
ප්‍රේක්ෂකයන් ඇ වැළඳගනී

ඇගේ
රඟපෑම් විශිෂ්ට යැයි එකෙක් කීය
සියුමැලි යුවතියක වූ
ඇගේ රඟපෑම්
මා සිත සසල කරවී
ඇට ප්‍රසාදය පළ කරනු සඳහා
මා නේපථ්‍යාගාරයට යන විට
ඇගේ තන පුඩුවක්
බිළිඳකු විසින්
උරනු දුටිමි
ඇ දක්ෂ නිළියක් නොවේයැයි
මට හදිසියේ
සිතිණ.

**උදේනි සරත්චන්ද්‍ර**
**"සොල්දාදුවා සහ විජිතය"**
කාව්‍ය සංග්‍රහයෙන්

## උනුත් දැන ගත යුතු යි

කොට්ටම්බ ගස වෙමි
රකින දහසක් කුඩ ඉහළගෙන
පාමුල සිටින නුඹ

තව ටික වෙලාවකින්
මුරුගසන් වරුසාව වී අහස
බුරාගෙන පනිනු ඇත

පුත යන්න තාම සිරිපොද වැස්ස
ගොස් එන්න යළි බෙහෙත් දැන උගෙන
තෙමුණා ම හැදෙන ලෙඩ දුකට

ඒ එනකොට වරුසාවට
ගොදුරු වී මා මෙතැන
නො හිටින්නට ද පුළුවන

ඒත් නුඹ ආ යුතු ය

ළඟ පාත තව තිබේ
කොට්ටම්බ ගස් එමට

වහින වෙලාවක
නුඹේ පොඩි උන් ද
සිටිය යුතු යි
ටික වෙලාවක් හෝ
කොට්ටම්බ ගසක් යට

**ගැමුණු පී. දසනායක**




සංස්කරණය
**තුෂාරී ප්‍රියංගිකා**

*මාරයා කී කතාව*

*සිල් ගන්න හිත නැතිනම්*
*බණ අහන්නත් බැරි නම්*
*මක් කොරන්නද එහෙනම්*
*කවි පොතක්වත් ලියපං.....!*

*වර්ණ රසිකා*

## වස්සානය නැවත ආයේද?

කොහි ගියෙද කුරුළු රැළ
ගියෙද උණුසුම් කැදැලි සොයා උන්
දුටුවෙහිද අසනියක බිඳ දැමූ යුරු
මධුර ගායනා
කොහි ගියෙද බිඟු රෑන
ගියෙද නව මල් කැකුළු සොයා උන්
ඇසුනෙහිද මාරුතය සිඳ දැමූ යුරු
බමර ගායනා
වස්සානය නැවත ආයේද?
ලෝ දහම නොවෙද එය
කැකුළු පිබිදේ - රොන් සැලේ
මල් පරවේ
දරාගත හැකිද එනමුදු
විසිරෙනා කල සොඳුරු මල් පෙති.

**චන්ද්‍රිකා ද සිල්වා**

## චූටි පුතා -විදසුන්

චූටි පුතා හිනැහෙන විට හරිම ලස්සනයි
හිනැහෙන විට සිහින්ව යන දෑස ලස්සනයි
රැළි රැළි නැති දිගු කෙස් වැටි හරිම ලස්සනයි
මහතත් නැති කෙට්ටුත් නැති සිරුර ලස්සනයි

දුවන පුතුගේ චූටි දෙපා හරිම ලස්සනයි
පන්දු යවන චූටි ඇඟිළි හරිම ලස්සනයි
අක්කා සමඟ නටන නැටුම් හරිම ලස්සනයි
චූටි පුතා -විදසුන්" ඔබ හරිම ලස්සනයි

පන්සල් ගොස් බුදුන් වඳින විටත් ලස්සනයි
සුදු වැලි මත වැටී හඬන විටත් ලස්සනයි
දුරු රට සිට මා අමතන හඬත් ලස්සනයි
චූටි පුතා තාම ඔබේ සිතත් ලස්සනයි

**සුවිනීතා විජේසිංහ**

## මිනිස්සු



සරල බව නොදකිති
නොඅගයති
හුදු සංකීර්ණත්වයම සොයති.
පස් දොර නොවසති
ඉඳුරන් සතපවති
ශාන්තිය නැතැයි මොර දෙති.
ගුණ දම් සිඳිති
පිටු දකිති
කෙළෙස් බරින් මියැදී
නිර්වාණයම පතති.

**ශ්‍රියා කුමාරසිංහ**

## නෙතු පියන් නුඹ සොයයි

ඔබ හා බැඳුණු මගෙ ආදරයේ තුරුණු
තිබුණේ සෙනෙහසයි නොසිඳෙන ලෙස පිරුණු
මගෙ ලෙන්ගතු කමට හිත තුළ රැඳුණු
ඇයි කුමරියේ එක් කලෙ නැවතුමෙ ලකුණු

නින්ද නැති හැම රෑම මම ආවෙ නෙතු ඉමට
දැනුණාද මගේ සෙනෙහසේ අඩුවක් නුඹට
දැනුත් සිහි වෙනවා එදා සිතුවම් පෙළට
ඇයි මෙහෙම ගින්දරක් දුන්නෙ නුඹ මගෙ හිතට

නෙතු පියන් රෑ පුරා නිදි වරා නුඹ සොයයි
සිත් අහස නුඹ ලීව පෙම් කවිය හැර නායයි
නොදැනීම දෙනෙත් අග කඳුළු බිඳු දඟ කරයි
ජීවිතයේ සතුට දුන් ඔබ මගේ ලෝකයයි

එදා වාගෙම අදත් සරා සඳ නැගෙනවා
අපි ඇවිද ගිය පාරෙ තවත් මල් පිපෙනවා
නුඹ මගේ ළඟ තාම ඉන්නවා හැඟෙනවා
එදා වාගෙම අදත් නුඹෙ සුවඳ දැනෙනවා

**සමන් රණසිංහ**
රෝමය-ඉතාලිය

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.